Embassy of the United States of America
Colombo

# PRESS RELEASE

Public Affairs Section
Tel: +94 (11) 249-8100 ● Fax: +94 (11) 244-9070
Email: shenjy@state.gov ● http://srilanka.usembassy.gov

Release No. 20160515

**මේජර් ජෙනරාල් ස්ටීවන් ආර්. රඩර් ශ්‍රී ලංකාවේ සංචාරයක**

මැයි 15, 2016: එක්සත් ජනපද ශාන්තිකර කලාපිය විධානයේ උපාය මාර්ගික සැලසුම් සහ ප්‍රතිපත්ති පිලිබඳ අධ්‍යක්ෂක, මේජර් ජෙනරාල් ස්ටීවන් ආර්. රඩර්, මැයි 11- 13 දිනයන් හිදී, තම තුන්-දින ශ්‍රී ලංකා සංචාරය නිම කළේය. මෙම සංචාරය, මෑතකදී එක්සත් ජනපද හත්වැනි බලඇණියේ අණ දෙන USS 'බ්ලූ රිජ්' නෞකාවේ මෙරට සම්ප්‍රාප්තියට පසුව සිදුවන්නක් වන අතර, ශාන්තිකර කලාපීය විධානයේ ජ්‍යෙෂ්ඨ නායකයෙකු විසින් ශ්‍රී ලංකාවේ සිදුකරන ප්‍රථම සංචාරය ද වේ.

ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ එක්සත් ජනපද තානාපති, අතුල් කෙශප් පවසන පරිදි, ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටා ඇති අයුරු උපාය මාර්ගික වැදගත්කමක් හොබවයි. එම නිසා, ශ්‍රී ලංකාවට කලාපීය සාගර ආරක්ෂාව, ස්වභාවික විපත් වලදී ප්‍රතිචාර දැක්වීම සහ නාවික ගමනාගමනයේ නිදහස සුරැකීම යන අංශ තුළ වැදගත් භූමිකාවක් ඉටු කල හැකි බව කෙශප් මහතා පෙන්වා දෙයි.

මේජර් ජෙනරාල් රඩර්, ලංකාවේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ ආරක්ෂක සේවාවන්හි අණදෙන නිලධාරීන් හමු විය. ඊට අමතරව ඔහු ලොව කාර්යබහුලතම අන්තර්-නැව්ගත බහාලුම් මධ්‍යස්ථාන අතරින් 14 වැනි ස්ථානයේ පවතින කොළඹ වරායේ, නෞකා මාර්ග සුරැකීම භාරව ඇති බටහිර ප්‍රදේශීය නාවික විධානයේ ද සංචාරයක නිරත විය. ඔහුගේ ශ්‍රී ලංකා සංචාරයේ ප්‍රධානතම අරමුණු වූයේ අනාගතයේ දෙරට අතර සහයෝගිතාව වර්ධනය කළ හැකි - සාගර ආරක්ෂාව පිළිබඳ තීරණාත්මක ගැටලු, මානුෂීය ආධාර සහ ආපදා සහන සැපයීම් සහ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් වැනි - අංශ හඳුනා ගැනීමයි.

ලාංකීය ආරක්ෂක හමුදා මෑතකදී එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා අතිරේක සහාය පලකර ඇති අතර, වර්තමානයේ ලෙබනනයේ, දකුණු සුඩානයේ සහ මධ්‍යම අප්‍රිකානු ජනරජයේ ඇති සෙබලුන් ස්ථානගත කිරීම් වැඩි දියුණු කරමින් පවතී.

###